**ශීර්ෂය 120 - කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය**

**------------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**----------------**

### 1.1 තත්ත්වාගණනය කල මතය

**------------------------------**

කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 29 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 31 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**------------------------------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

**------------------------------------------------------------------------------------------------**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන

ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරනගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනා ගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනා ගත් වැදගත් විගණන සොයා ගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳ ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (ඇ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) අමාත්‍යාංශය විසින් ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින්, මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව ප්‍රකාශ කළ නොහැකි විය.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-----------------------------------------

### 1.6.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

--------------------------------

**(අ) මූලධන වියදම්**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අංක 120-02-03-20-2509 දරන හා අංක 120-02-04-15-2509 දරන වැය විෂයයන් ගේ අරමුණුවලට පටහැනිව කාර්යාල උපකරණ මිලදී ගැනීම වෙනුවෙන් රු.1,638,790 ක් වැය කර තිබුණි. | මූලධන වත්කම් අත්පත් කර ගැනීමට දරන වැය අදාල ප්‍රතිපාදන යටතේ දැරිය යුතු බව හා අදාල වැය විෂයයන්ගේ අරමුණු සඳහා දරන වියදම් එම වැය විෂයයන් යටතේ දැරිය යුතු බව. | සංවර්ධන වැඩසටහන් සඳහා මිලදී ගන්නා බැවින් අදාළ වියදම් මෙම වැය විෂයය යටතේ දරා ඇත. |

**(ආ) අග්‍රිම ශේෂය**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළ භාණ්ඩාගාරයෙන් ලැබුණු අග්‍රිම එකතුව රු.892,679,098 ක් වුවද, මූල්‍ය කාර්යසාධන වාර්තාවේ එය රු.904,671,322 ක් ලෙස සඳහන් කිරීම හේතුවෙන් රු.11,992,224 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | භාණ්ඩාගාරයෙන් ලද අග්‍රිම නිවැරදිව මූල්‍ය ප්‍රකාශනවල සටහන් කළ යුතු බව. | භාණ්ඩාගාරය විසින් සිදු කරන ලද වරද නිවැරදි කර ගැනීම සඳහා මූල්‍ය ප්‍රකාශනවල සටහන් කරන ලදී. |

**1.6.2 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

**-------------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| **හානි පිළිබඳ ලේඛනය**<br>මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව හානි පිළිබඳ ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 110 හි විධිවිධාන ප්‍රකාර ඒ යටතේ වන ආකෘතිය අනුව හානි පිළිබඳ ලේඛනයක් පවත්වා ගත යුතු බව. | පිළිතුරු ලැබී නොමැත. |

**1.6.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

**-----------------------------------------------**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නිරීක්ෂණය | | | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- | --- | --- |
| | **නීති, රීති හා රෙගුලාසිවලට යොමුව** | **වටිනාකම රු.** | **අනුකූල නොවීම** | | |
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | | |
| | **i.** මුදල් රෙගුලාසි 633 | 6,336,399 | සහරා, අත්පත්‍රිකා හා පොත් බැඳීම් අදාල රෙගුලාසි ප්‍රකාරව රජයේ මුද්‍රණාලය මගින් සිදු කරවා ගැනීමකින් තොරව පෞද්ගලික මුද්‍රණාල මඟින් සිදුකර ගෙන තිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | පිළිතුරු ලැබී නොමැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | **ii.** මුදල් රෙගුලාසි 103 (1) (ඊ) | 13,902,198 | අවස්ථාවන් 3 කදී සිදුවූ වාහන අනතුරු සම්බන්ධයෙන් සිදු වූ අලාභ හානි අයකර ගැනීමට ක්‍රියාකර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | පසුව පිළිතුරු ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. |
| **(ආ)** | 1999 ඔක්තෝබර් 08 දිනැති අංක 22/99 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | **-** | අමාත්‍යාංශයේ ලේකම්වරු දෙදෙනෙකු විසින් තමන්ගේ සේවා කාලය තුළ වාහන දෙක බැගින් භාවිතා කර තිබුණි. | චක්‍රලේඛ විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතු බවට අවධාරණය කළ යුතු වීම. | මෙම අමාත්‍යාංශයේ රාජකාරී කළ පූර්වගාමී ලේකම්වරුන් විසින් පවත්වා ගෙන එන ලද ක්‍රියාදාමයකි. |

## 2. මූල්‍ය සමාලෝචනය

----------------------

### 2.1 වියදම් කළමනාකරණය

--------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| **(අ)** | වැය විෂයයන් 09 ක් සඳහා සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 40 සිට සියයට 99 දක්වා පරාසයක ප්‍රමාණයක් ඉතිරි වී තිබුණි. | නිවැරදිව ඇස්තමේන්තු පිළියෙල කළ යුතුය. | අවශ්‍යතා මතු නොවීම, දේශපාලන වාතාවරණය, ළමා ආරක්ෂක අධිකාරියේ පැවති පරිපාලනමය ගැටළු මෙම ඉතිරිවීම් සඳහා හේතු වී ඇත. |
| **(ආ)** | සමාලෝචිත වර්ෂය තුළ වැය විෂයයන් 3 ක් සඳහා රු.367,500,000 ක පරිපූරක ප්‍රතිපාදන සලසා ගෙන තිබූ අතර, වර්ෂය අවසාන වන විට ඉන් රු.54,741,448 ක් වියදම් නොකර ඉතිරි වී තිබුණි. | නිවැරදිව ඇස්තමේන්තු පිළියෙල කළ යුතුය. | ශක්‍යතා අධ්‍යයනයේ දී ප්‍රායෝගික ගැටළු මතු වීම, පෙර පාසල් හඳුනා ගැනීම හා තොරතුරු ලබා ගැනීම සඳහා කාලයක් ගත වීම, ළමා ආරක්ෂක අධිකාරියේ පැවති පරිපාලන ගැටළු යනාදී කරුණු මත මෙම ප්‍රතිපාදන ඉතිරි වී ඇත. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

----------------------------

### 3.1 දැක්ම හා මෙහෙවර

---------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ළමා හා කාන්තා අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම සඳහා යහපාලන භාවිතාවන් තහවුරු වන පරිදි අදාල අවශ්‍යතා සම්පාදනය කිරීම සහ ප්‍රතිපත්ති සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම හා නියාමනය කිරීම අමාත්‍යාංශයේ මෙහෙවර වුවද, ළමා හා කාන්තා අයිතිවාසිකම් තහවුරු කිරීම, ආරක්ෂා කිරීම, ප්‍රවර්ධනය කිරීම සඳහා සම්පාදනය කළ නීති හා සකස් කළ ප්‍රතිපත්ති බලාත්මක කර ක්‍රියාත්මක කර නොතිබුණි. | දැක්ම හා මෙහෙවරට අනුකූලව කටයුතු කළ යුතුය. | පිළිතුරු ලැබී නැත. |

### 3.2 සැලසුම් කිරීම

-----------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 ඡේදය ප්‍රකාරව අදාල වර්ෂයට යාවත්කාලීන කළ ආයතනයේ සංවිධාන ව්‍යුහය, අනුමත කාර්ය මණ්ඩලය සහ දැනට සේවයේ සිටින කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර අන්තර්ගත වන පරිදි ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතු වීම. | ඉදිරියේ දී නිවැරදිව පිළියෙල කරනු ලැබේ. |

## 3.3 අපේක්ෂිත නිමැවුම් මට්ටම ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ගොවිජන මන්දිරයේ කොටසක දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් ඉදිකිරීම සහ අවශ්‍ය උපකරණ ලබා දීම සඳහා රු.මිලියන 1.5 ක ප්‍රතිපාදිත මුදලින් රු.1,257,000 ක් පාර්ලිමේන්තු මහලේකම් වෙත 2018 සැප්තැම්බර් යවා තිබුණු අතර, එම මුදල් අදාල කාර්යය සඳහා යෙදවීමකින් තොරව පොදු තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි. | ප්‍රතිපාදන උපරිම කාර්යක්ෂමතා වයකින් භාවිතා කළ යුතු වීම. | පිළිතුරු පසුව යොමු කිරීමට කටයුතු කරනු ලැබේ. |
| (ආ) | විදේශගත වීමට අපේක්ෂිත කාන්තාවන් සඳහා විකල්ප ආදායම් උත්පාදන වැඩසටහන වෙනුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 13 ක ප්‍රතිලාභීන් 81 ක් සඳහා රු.මිලියන 2 ක ප්‍රතිපාදන සලසා තිබුණ අතර, ඉන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 7 ක ව්‍යාපෘති 55 ක් ආරම්භ කර තිබුණේ අවසාන කාර්තුවේ ය. | ක්‍රියාකාරී සැලැස්මට අනුව කාර්යක්ෂමව කටයුතු කළ යුතුය. | පිළිතුරු පසුව යොමු කිරීමට කටයුතු කරනු ලැබේ. |
| (ඇ) | කාන්තාවන් හා දරුවන් සඳහා ක්ෂණික සහන ලබා දීම සඳහා සමාලෝචිත වර්ෂයේ දී රු. මිලියන 3 ක ප්‍රතිපාදන සලසාගෙන තිබුණ අතර, සමාලෝචිත වර්ෂය තුළ ප්‍රතිලාභීන් 6 දෙනෙකු සඳහා පමණක් රු.378,329 ක ප්‍රතිලාභ ලබා දී තිබුණි. | ව්‍යාපෘතියේ අරමුණු ඉටුවන ලෙස ප්‍රතිපාදන උපරිම කාර්යක්ෂමතා වයකින් උපයෝජනය කළ යුතු වීම. | ප්‍රතිලාභීන් ඉල්ලුම් නොකරන ලදී. |
| (ඈ) | ගරු රාජ්‍ය අමාත්‍යතුමිය 2018 සැප්තැම්බර් 27 වන දින ඉල්ලා අස් වී තිබුණු අතර, අංක 120-1-11-1409 දරන රාජ්‍ය අමාත්‍යාංශ වැය විෂයය යටතේ රු.350,000 ක් වියදම් කර ඔක්තෝබර් 11 දින අමාත්‍යවරයා සඳහා කුලී පදනම මත වාහනයක් ලබා ගෙන තිබුණි. | නිවැරදි වැය විෂයයන් යටතේ වියදම් දැරිය යුතුය. | රාජ්‍ය අමාත්‍යතුමියගේ ධූරයෙන් ඉල්ලා අස් වීමෙන් පසුව එම තනතුරේ කටයුතු ද අමාත්‍යතුමිය විසින් ආවරණය කරන ලදී. |
| (ඉ) | එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදලින් (UNFPA) ක්‍රියාත්මක වන ප්‍රජනන සෞඛ්‍ය සඳහා ඇති හිමිකම් ප්‍රවර්ධනය කිරීම සහ දත්ත පද්ධතියක් ශක්තිමත් කිරීම සඳහා වාර්ෂික ඇස්තමේන්තුවෙන් | අරමුණු ඉටුවන සේ ප්‍රතිපාදන උපරිම කාර්යක්ෂමතා වයකින් | දිස්ත්‍රික්ක සහ ප්‍රාදේශිය වැඩමුළු සංවිධානය කිරීමට සැලසුම් කළ ද, පැවති දේශපාලන වාතාවරණය මත මෙම වැඩසටහන් පැවැත්විය |

| | | | |
|---|---|---|---|
| | රු.22,800,000 ක් වෙන් කර තිබුණ ද, 2018 වර්ෂයේ 3 වන කාර්තුවේ රු.1,098,455 ක් ලැබී තිබූ අතර, ඉන් රු.72,693 ක් පමණක් වියදම් කර තිබුණි. | උපයෝජනය කළ යුතුය. | නොහැකි විය. |
| (ඊ) | දිරිය කාන්තා වැඩසටහන යටතේ කාර්යයන් 3 ක් හා ජාතික කාන්තා කමිටුවේ කාර්යයන් 4 ක් සඳහා රු.මිලියන 9.56 ක ප්‍රතිපාදන සලසා තිබුණි. සමාලෝචිත වර්ෂය තුළ රු.මිලියන 2.22 ක් පමණක් වැය කර තිබුණු අතර භෞතික ප්‍රගතිය සියයට 10 සිට සියයට 40 දක්වා අඩු මට්ටමක පැවතුණි. | අරමුණු ඉටුවන සේ ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව කටයුතු කළ යුතුය. | පිළිතුරු පසුව යොමු කිරීමට කටයුතු කරනු ලැබේ. |
| (උ) | එදිනෙදා ජීවිතයේ දී කාන්තාවන්ට සිදුවන හිංසනය හා පවතින අභියෝගවලට එලදායී ලෙස මුහුණ දීම සඳහා අවබෝධයක් ලබා දීමත්, යම් ආකාරයක සහනයක් ලබා දීමත් ආදී අරමුණු කර ගෙන කෘතියක් එළිදැක්වීමට රු.200,000 ක ප්‍රතිපාදන සලසා ගෙන තිබුණි. සංකල්ප පත්‍රිකාවට අනුව 2018 මාර්තු වන විට කෘතිය එළිදැක්වීමට හා පිටපත් 1,000 ක් මුද්‍රණය කිරීමටද අපේක්ෂා කර තිබුණි. මෙම කාර්ය සඳහා රු.180,550 ක් වියදම් කර තිබුණ ද, 2019 මැයි 20 විගණන දින වන විටත් පිටපත් 350 ක් පමණක් බෙදා හැර තිබුණි. | අපේක්ෂිත අරමුණු ඉටුවන සේ ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව කටයුතු කළ යුතු වීම. | පිළිතුරු පසුව යොමු කිරීමට කටයුතු කරනු ලැබේ. |

**3.4 අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම**

---------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | පාරිසරික සංචාරක කර්මාන්ත ක්ෂේත්‍රය සඳහා කාන්තාවන් දිරිගැන්වීම සහ ඔවුන් සවිබල ගැන්වීමේ ව්‍යාපෘතිය සඳහා සමාලෝචිත වර්ෂය තුළ රු. මිලියන 4 ක ප්‍රතිපාදන සලසා ගෙන අලෙවි මධ්‍යස්ථාන 2 ක් ඉදිකිරීමට සැලසුම් කර තිබුණ ද, රු. මිලියන 1.01 ක් වැය කර එක් මධ්‍යස්ථානයක් පමණක් ඉදිකර තිබුණි. 2017 වර්ෂයේ රු. මිලියන 5.47 ක් වැය කර අලෙවි මධ්‍යස්ථාන 2 ක් ඉදිකර තිබුණ ද, විගණිත දිනය වූ 2019 මැයි 08 දින වන විටත් එක් මධ්‍යස්ථානයක් පමණක් විවෘත | අපේක්ෂිත ප්‍රතිලාභ ලබා ගැනීමට කටයුතු කළ යුතු වීම. | පිළිතුරු පසුව යොමු කිරීමට කටයුතු කරනු ලැබේ. |

කර තිබුණි.

| | | | |
|---|---|---|---|
| (ආ) | අවදානමට ලක් වූ කාන්තාවන් හා ඔවුන්ගේ පවුල් සඳහා සහන සැලසීම අරමුණු කර ගෙන රු. මිලියන 3 ක ප්‍රතිපාදන සලසා ගෙන වැඩසටහන් 08 ක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණ ද, එම වැඩසටහන් ඉටු නොකර පවුල් 31 ක් සඳහා සනීපාරක්ෂක පහසුකම් ලබා දීම සඳහා රු. මිලියන 0.93 ක් වැය කර තිබුණි. | ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව ප්‍රතිපාදන ලබා ගත් අරමුණු වෙනුවෙන් මුදල් වැය කළ යුතු වීම. | පිළිතුරු පසුව යොමු කිරීමට කටයුතු කරනු ලැබේ. |

## 3.5 කළමනාකරණ දුර්වලතා

--------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | තිරසාර කෘෂි ව්‍යාපෘතිය යටතේ 2017/2018 වර්ෂවල රු.මිලියන 2.2 ක ප්‍රතිපාදන ප්‍රාදේශීය ලේකම් කාර්යාල 22 කට යවා තිබූ අතර, මෙම ප්‍රතිපාදනවලින් රු. 296,950 ක් හා අය කරගත් වාරික රු. 938,457 ක් නිසි අනුමැතියකින් තොරව කාන්තා බලමණ්ඩල යටතේ ආරම්භ කරන ලද කෘෂි ගිණුම් 19 ක තැන්පත් කර තිබුණි. | නිසි අනුමැතියකින් තොරව ආරම්භ කළ ගිණුම්වල මුදල් තැන්පත් නොකළ යුතු බව. | ඉදිරියේ දී මෙම අඩුපාඩු නිවැරදි කර ගැනීමට කටයුතු කරනු ලැබේ. |
| (ආ) | සංචාරක අමාත්‍යාංශය මඟින් සිදුකරවා ගැනීමට නියමිතව තිබූ අම්පාර දිස්ත්‍රික්කයේ පොදු වෙළඳ සංකීර්ණය ඉදිකිරීමේ කාර්යය ප්‍රාදේශීය ලේකම්ගේ හෝ සංචාරක අමාත්‍යාංශයේ කිසිදු ඉල්ලීමකින් තොරව මෙම අමාත්‍යාංශය භාර ගෙන 2017 හා 2018 වර්ෂවල දී ඉදිකිරීම් කටයුතු වෙනුවෙන් රු.මිලියන 5.5 ක් වැය කර තිබුණි. | නිසි අධිකාරී බලයකින් තොරව ගනුදෙනුවලට නොඑළැඹිය යුතු බව. | සංචාරක අමාත්‍යාංශය මඟින් ප්‍රතිපාදන ලබා දීම සිදු නොකරන ලදී. |

## 3.6 ප්‍රසම්පාදනයන්

----------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| **(අ)** කාන්තා ගීතය ප්‍රතිනිර්මාණය කිරීම හා ළමා අයිතීන් පිළිබඳ සම්මුතිය ක්‍රියාත්මක කිරීම සඳහා දත්ත පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා රු.2,688,400 ක් වියදම් කර තිබූ අතර, ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ පරීක්ෂාවේ දී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයෙහි 6.3.6 වගන්තිය, 2.6.1 (අ) (ii) හා 2.8.1 (ආ) වගන්ති ප්‍රකාරව වාර්තා තබා නොගැනීම, තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් පිරිවිතර සමාලෝචනය හා අනුමත නොකිරීම, තාක්ෂණික ඇගයීම් කමිටු පත් කර නොතිබීම හා විෂය ක්ෂේත්‍රය සම්බන්ධ ප්‍රවීන සාමාජිකයකු සහභාගී කරවාගෙන නොතිබීම යන අඩුපාඩු නිරීක්ෂණය විය. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූලව කටයුතු කළ යුතුය. | දක්වන ලද දෝෂ නිවැරදි කර ගැනීමට කටයුතු කරනු ලැබේ. |
| **(ආ)** ලෝක ළමා දින ජාතික උත්සවය සඳහා සහරා මුද්‍රණය, ආහාරපාන, වේදිකා සැරසිලි සහ බෑග් මිලදී ගැනීම සඳහා රු.2,437,000 ක් වැය කර තිබුණ අතර, එම ප්‍රසම්පාදනයේ දී ප්‍රසම්පාදන කමිටු තීරණ නොගැනීම, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.8.1 ඡේදය ප්‍රකාරව තාක්ෂණික ඇගයීම් කමිටු පත් කර නොතිබීම යන අඩුපාඩු නිරීක්ෂණය විය. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූලව කටයුතු කළ යුතුය. | පිළිතුරු ලැබී නැත. |

**3.7** අනාර්ථික ගනුදෙනු

---------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ජාත්‍යන්තර කාන්තා දින ජාතික උත්සවය සැමරීම සඳහා දිරිය කාන්තා වැය විෂයය යටතේ රු.මිලියන 10 ක ප්‍රතිපාදන සලසා තිබුණි. වේදිකා නිර්මාණය, ශබ්ද විකාශන හා මාධ්‍ය කටයුතු සඳහා ද, ආහාරපාන සඳහා ද, පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත බැඳීම් පත්‍ර මඟින් ප්‍රතිපාදන යැවීම සඳහා වූ බාහිර ක්‍රියාකාරකම් වෙනුවෙන් රු.මිලියන 8.78 ක් වැය කර තිබුණි. කාන්තාවන් මුහුණපාන බරපතල සමාජීය හා ආර්ථික ගැටළු නිරාකරණය කර ගැනීම සඳහා තිරසාර ක්‍රමෝපායන් හඳුන්වා දී ක්‍රියාත්මක කිරීම සඳහා මෙම මුදල් වැය කළ හැකිව තිබුණි. | අරමුදල් කාර්යක්ෂමව හා ඵලදායීව උපයෝජනය කළ යුතුවීම. | පිළිතුරු ලබා දී නොමැත. |

**3.8** වත්කම් කළමණාකරනය

----------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) 2015 වර්ෂයේ දී කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයේ රාජ්‍ය ඇමතිතුමියගේ කාර්යයන් සඳහා ලබා දී තිබූ මෝටර් රථයක් එම වර්ෂයේදීම අනතුරට භාජනය වී තිබුණු අතර, විමර්ශන වාර්තාවට අනුව මෙම වාහනය අනතුරට පත්වන අවස්ථාවේ දී පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුගේ පෞද්ගලික රියැදුරෙකු වාහනය ධාවනය කර තිබුණි. එම වාහනය වෙනත් මන්ත්‍රීවරයෙකුගේ භාවිතය සඳහා යෙදවීම පිළිබඳව අමාත්‍යාංශය දැනුවත් වී නොතිබුණු බවත් විමර්ශන වාර්තාවෙන් තහවුරු විය. | රජය සතු වත්කම් නිසි අධිකාරී බලයකින් යුතුව භාවිතා කළ යුතු වීම. | අදාල නඩුව අධිකරණයේ විභාග වෙමින් පවතී. |

| | | |
|---|---|---|
| (ආ) අමාත්‍යාංශය සතු වාහන 17 ක් අවිධිමත් ලෙස බාහිර පාර්ශවයන් වෙත මුදා හැර තිබුණි. | විධිමත් පරිදි පැවරීමේ කටයුතු සිදු කිරීම හෝ එම වාහන නැවත ලබා ගෙන සුදුසු පරිදි කටයුතු කිරීම. | පැවරීමේ කටයුතු ඉතා කඩිනමින් සිදු කරන බව. |
| (ඇ) අමාත්‍යාංශය විසින් විධිමත් පරිදි පවරා නොගත් ඉඩමක රු.මිලියන 25 ක් වැය කර 2001 වර්ෂයේ දී බියගම කාන්තා නේවාසිකාගාරයක් ඉදිකර තිබූ අතර, 2019 මැයි 20 විගණන දින වන විටත් එම ඉඩම පවරා ගෙන නොතිබුණි. | පවරා ගැනීමට/ පවරා දීමට කටයුතු කළ යුතුවීම. | පවරා දීමේ කටයුතු සිදුවෙමින් පවතී. |
| (ඈ) මෙම අමාත්‍යාංශය විසින් භාවිතා කරන වෙනත් අමාත්‍යාංශ සතු වාහන 13 ක් මෙම අමාත්‍යාංශය වෙත පවරා ගැනීම සඳහා විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | පවරා ගැනීමට කටයුතු කළ යුතුවීම. | පවරා දීමේ කටයුතු සිදුවෙමින් පවතින බව. |